ශ්‍රී ලංකා පොලිසියේ සංඛ්‍යාලේඛන අනුව, 2020 වසර තුළ ශ්‍රී ලංකාව තුළ වාර්තා වූ දිවි තොර කරගැනීම් ප්‍රමාණය 3,074 ක් වේ. එනම්, ශ්‍රී ලංකාව තුළ දිනකට දිවි තොර කරගැනීම් සාමාන්‍යය 8.4 ක් වේ. මෙම දිවි තොර කර ගැනීම් සෑම එකකටම පාහේ දිවි තොර කරගැනීමට තැත් කිරීම්ද ගණනාවක් තිබිය හැකි බවද සැලකිල්ලට ගත් විට, මෙම සමාජ සෞඛ්‍ය ගැටළුවේ පරිමාණය අපට සිතා ගැනීමට හැකියාව ඇත. මෙවැනි සිදුවීම් වාර්තා කිරීමේදී විශේෂ ප්‍රවේසමක් සහ ආචාර ධර්මානුකූල ප්‍රවේශයක් අනිවාර්ය වන්නේද ඒ නිසායි.

නමුත් බොහෝ මාධ්‍ය තවමත් දිවි තොරකරගැනීම් පිළිබඳව වාර්තා කිරීමේදී එම ආචාර ධර්මානුකූල ප්‍රවේශයට අනුගතව නොතිබීම කණගාටුවට කරුණකි. උදාහරණ ලෙසින් පහත පුවත් වාර්තාවන් පෙන්වා දිය හැක.

මෙම පුවත් වාර්තාවන් තුළ දිවි තොර කරගත් ආකාරය දක්වා ඇති අතර, එය දීර්ඝ වශයෙන් විස්තර කර ඇත. එය, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකුට එම ක්‍රම අනුගමනය කිරීම සඳහා පෙළඹවීමක් විය හැක.

එසේම, මෙවැනි පුවත් වාර්තාවන් හා උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ දිවි අහිමි කරගැනීමේ නැඹුරුවක් ඇති තවත් අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඉඩක් ලැබීමට හැක.

මෙම දිවි තොර කරගැනීම පිළිබඳ පුවත එදින ඉංග්‍රීසි පුවත්පත් තුළ පළවී නොතිබූ බවද සඳහන් කළ යුතු වේ.

මූලාශ්‍ර:
https://www.police.lk/index.php/item/138
https://media.samaritans.org/.../Samaritans_Media...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860

*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #Divaina**